## හැඳින්වීම

"විශුද්ධිමාර්ග සන්නය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්" යන මාතෘකාව යටතේ රචිත මෙම පර්යේෂණ නිබන්ධය රුහුණු විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන්නකි.

දෙ වැනි පැරකුම්බා රජු විසින් රචනා කරන ලද විශුද්ධිමාර්ග සන්නය දඹදෙණි රාජ්‍ය සමය තුළ පමණක් නො ව මුළු සිංහල සම්භාව්‍ය සාහිත්‍ය ඉතිහාසය තුළ රචිත ග්‍රන්ථ අතුරෙහි අති විශිෂ්ට ගණයෙහි ලා සැලකෙන්නකි. මෙය කොටස් වශයෙන් හෝ කරන ලද සංස්කරණ වශයෙන් නූතන සිංහල පාඨකයන් වෙත සැපයී ඇත්තේ වුව ද, එම කෘතිය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් කරන ලද බවට සාක්ෂි නැත.

මෙහි බොහෝ අංශ පිළිබඳ සුළුවෙන් හෝ අධ්‍යයනයක් කර ඇත්තේ කුලසූරිය මහතා විසින් තම සිංහල සාහිත්‍යය 2 නම් කෘතියේ දී ය. ඇතැමෙක් එහි එක් අංශයක් දෙකක් ගැන පමණක් තොරතුරු මතුපිටින් පැවසූහ. ඒ බව මෙහි දක්වා ඇත.

මෙම පර්යේෂණයේ දී විශුද්ධිමාර්ග සන්නය රචනා වීමට බලපෑ කරුණු මූලික ව සාකච්ඡාවට ලක් කර ඇත. මෙහි ප්‍රමාණය හා සන්දර්භය මූල ග්‍රන්ථය වන පාලි 'විසුද්ධිමග්ගය' හා සන්සන්දනය කරමින් ඉදිරිපත් කර තිබේ. සන්න ග්‍රන්ථයක් වශයෙන් මෙම විශුද්ධිමාර්ග සන්නයෙහි ඇති විශේෂතා පිළිබඳ වෙන ම අධ්‍යයනයක් කර ඇති අතර එය අන් සන්න ග්‍රන්ථ සමඟ තුලනය කරමින් විශුද්ධිමාර්ග සන්නයෙහි ඇති විශේෂ ලක්ෂණ හා අන් කෘතිවල දක්නට ඇති සමාන කම් ද හෙළි දරව් කර තිබේ.

අර්ථ ව්‍යාඛ්‍යානය කිරීමේ දී සිංහල සන්න කරුවන් ගත් මග බෙහෙවින් අනුගමනය කරමින් විශුද්ධිමාර්ග සන්න කතුවරයා ද තම කෘතිය රචනා කර ඇති බව පෙනෙයි. එයින් පැරකුම්බා රජු ගේ දැනුමේ තරමත්, ඔහු මේ කෘතිය රචනා කිරීම සඳහා ආශ්‍රය කළ විවිධ පොත්-පත් ප්‍රමාණයත් පැහැදිලි වෙයි. ධර්මයෙහි ඇති ගැඹුරු දැනුම කෙතරම් ද යන්න මෙහි සත් වැනි පරිච්ඡේදයෙන් හෙළි වෙයි.

තත් කාලීන ජනයා ගේ සාමාජික සංස්කෘතික තොරතුරු ද මෙහි ඇතුළත් ව පවතින හෙයින් මෙම පයේෂණයේ දී ඒ පිළිබඳ විග්‍රහයක් ද සය වැනි පරිච්ඡේදයේ දී කර ඇත. එහි දී එකල ජනයා ගේ රැකියා, විශ්වාස, සිරිත්-විරිත් ආදිය විග්‍රහයට භාජන විය. මෙම සන්නයෙහි අන්තර්ගත භාෂාව පිළිබඳ ව සැලකීමේ දී කතුවරයා ගේ ව්‍යක්ත, නිවැරදි බස හා වාක් ප්‍රයෝග හෙළි විය. එයින් ඔහු සතු ව පැවති තර්කානුකූල ලිවීමෙහි කුශලතාව ද ප්‍රකට වෙයි.

මෙම සන්නයෙහි විශේෂ හා විසිතුරු ලක්ෂණයක් සේ හෙළි වූ යේ ප්‍රතිවාදීන් ගේ අදහස් සන්න කතුවරයා මතු කර දක්වා ඒවා විචාරයට ලක් කොට එම අදහස් බිඳ දමා තම අදහස කෘතිය පුරා ම ආරක්ෂා කළ ආකාරය යි. සමස්තයක් වශයෙන් විශුද්ධිමාර්ග සන්නය මුළු ථෙරවාද බුදුදහම අළලා රචිත ව්‍යක්ත රචනයක් උදෙසා කරන ලද සන්න ග්‍රන්ථයක් බවත් මුල් කෘතියෙහි දක්නට නැති **විස්තර** විශාල වශයෙන් හෙළි දරව් කරන කෘතියක් ලෙසත් හැඳින්විය හැකි වෙයි. මෙම පයේෂණයේ දී මා විසින් පයේෂණ කටයුතු සඳහා පරිහරණය කරනු ලැබුවේ බෙන්තර සද්ධාතිස්ස හිමියන් සංස්කරණය කළ විශුද්ධිමාර්ග සන්න කෘතිය බව ප්‍රකාශ කර සිටිමි. එහෙයින් මෙම නිබන්ධයෙහි විශුද්ධිමාර්ග සන්නයෙන් නිදර්-ශන සේ උපුටා දක්වා ඇති පාඨ උදෙසා සංකේතයක් දක්වා නැති අතර ඒ සඳහා පිටු අංක පමණක් දක්වා ඇති බව ද, මතක් කර සිටිමි.

මේ තරම් විශාල වටිනාකම් රැසක් ඇති පැරණි සිංහල සම්භාව්‍ය කෘතියක් වූ විශුද්ධිමාර්ග සන්නය පිළිබඳ ව පයේෂණයක් කිරීමට මා පොළඹවන ලද්දේ පැරණි සිංහල සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ කෙරෙහි දැඩි උනන්දුවකින් යුතු ව කටයුතු කරන රුහුණු විශ්වවිද්‍යාල-යේ සිංහල අධ්‍යයන අංශයේ මහාචාර්ය විනී විතාරණ මහත්මාණන් විසිනි. එ පමණක් නො ව මෙම පයේෂණයේ දී මා ගේ උපදේශකවරයා වශයෙන් ද කටයුතු කරමින් මා නොයෙක් වර දිරි ගැන්වූ යේ ද එතුමා ය. මෙම කටයුත්තේ දී විවිධ ගැටලු නොයෙක් වර මතු විය. ඒ හැම ගැටලුවක් ම ඉතා සරල ලෙසින් විසඳා පැහැදිලි කර දෙමින්, මෙම පයේෂණය සාර්ථක ව නිම කර ගැනීම දක්වා දුර්ලභ පොත්-පත් සපයා දෙමින් හා විවිධ දුර්වලතා පෙන්වා දෙමින් ද ඒවා නැවත සකස් කරවමින් මට මඟ පෙන් වූ මහාචාර්ය විනී විතාරණ මහත්මාට මා ගේ කෘතඥතා පූර්වක ස්තූතිය පළමු ව පිරි නැමෙයි.

දෙ වනු ව මෙම පයේෂණයේ කටයුතුවල දී මතු වූ සමහර ඓතිහාසික ගැටලු පිළිබඳ ව උපදෙස් දුන් මෙම විශ්වවිද්‍යාලයේ වැඩ බලන උප කුලපති මහාචාර්ය සිරිමල් රණවැල්ල මහත්මාට ද මා ගේ ස්තුතිය පිරිනැමෙමි.

තෙ වනු ව මෙම ශාස්ත්‍රීය පයේෂණ කටයුතු කර ගෙන යාමේ දී ඇතැම් පොත-පත සපයා දෙමින් නන් අයුරින් මා දිරිමත් කළ සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී.බී.ඒකනායක මහතාටත්, කථිකාචාර්ය අඟුලුගහ ධම්මින්ද හා කෝන්ගස්තැන්නේ ආනන්ද යන හිමිවරුන්ටත්, ඒන්ජල් කොටවලගෙදර මෙනවියටත් මා ගේ කෘතඥතා පූර්වක ස්තුතිය මම පිරිනමමි.

එ මෙන් ම මෙහි දී නොයෙක් උපදෙස් දෙමින් මේ සඳහා මා දිරි ගන්වමින් මට නන් අයුරින් උපකාර කළ මා ගේ සොයුරු කථිකාචාර්යවරුන් වන සෙනරත් ගමගේ පී.හේවගේ, එස්.වාවිවගේ සහ ඒ.කේ.ජී.ජයසිංහ යන මහත්වරුන්ටත් මෙම විශ්වවිද්‍යාල-යෙහි කථිකාචාර්යවරයෙකු ව සිටි සරත් අමරසිංහ මහතාටත් මා ගේ ස්තුතිය හිමි වෙයි. මා ගේ කුඩු මහත් සෑම කටයුත්තක දී ම නන් අයුරින් සහයෝගය දෙමින් දිරිමත් කරන අනුලා වික්‍රමසිංහ මහත්මියටත් මා ගේ ස්තුතිය හිමි වෙයි.

මෙයට

ජ.ඒ.වික්‍රමසිංහ